**කතරගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.67,575ක ශබ්ද විකාශන යන්ත්‍රය සහ රු.4,662,890ක ගොඩනැගිලි ඉදිකිරීම් හා සවිකිරීම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ සභාව සතු දේපළ ටෙන්ඩර් කිරීමේදී අයකර තිබුණු රු.3,190,902ක ඇප තැන්පත් ලැබිය යුතු කුලී ආදායම වෙනුවෙන් හිලව්කර තිබුණද, අදාල ගැලපීම් ගිණුම් තුල සිදුකර නොතිබුණි. මේ නිසා ටෙන්ඩර් ඇප තැන්පත් රු.3,190,902ක් වැඩියෙන්ද අතිරික්තය රු.2,508,914ක් සහ සමුච්චිත අරමුදල රු.681,988ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ඇසල උත්සව සමයේ තාවකාලික බිම්කට්ටි බදු දීමෙන් ලද රු.801,000ක් තාවකාලික වෙළඳබිම් කුලී ආදායම් ශීර්ෂයට බැර නොකර ටෙන්ඩර් තැන්පත් ගිණුමට බැරකිරීම නිසා සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් හා ටෙන්ඩර් තැන්පත් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු රු.1,000,000ක් ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර නොකර තැන්පත් ගිණුමට බැරකර තිබීම නිසා සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් හා තැන්පත් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත සඳහා ගෙවා තිබුණු රු.3,027,069ක් ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම් වියදම් ශීර්ෂය හර නොකර පොදු තැන්පත් ගිණුමට හරකර තිබීම නිසා එම වටිනාකමින් වර්ෂයේ වියදම් හා පොදු තැන්පත් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් රු.8,350,990ක් වූවද, එය රු.6,218,528ක් ලෙස ගිණුම්ගතකිරීම නිසා රු.2,132,462ක් අඩුවෙන් දක්වා තිබුණි. එබැවින් වර්ෂයේ වියදම් හා ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයහිමියන්ට ගෙවා තිබුණු රු.571,889ක් වියදම් ණයහිමියෝ ලෙස ගිණුම්ගතකර තිබීම නිසා කර්මාන්ත ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් හා වියදම් ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී වියදම් ණයහිමියන්ට ගෙවා තිබුණු රු.52,900ක් කර්මාන්ත ණයහිමි ගෙවීම් ලෙස ගිණුම්ගතකර තිබීම නිසා වියදම් ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් හා කර්මාන්ත ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂයේදී ගෙවා තිබුණු රු.1,313,479ක් කර්මාන්ත ණයහිමි යටතේද ගිණුම්ගතකර තිබීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකිරීම නිසා අදාල වටිනාකමින් කර්මාන්ත ණයහිමියන් වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) ලැබිය යුතු උසාවි දඩ ගිණුමේ ශේෂය රු.2,941,554ක් වූවද, එය රු.2,706,609ක් ලෙස දක්වා වෙනස හිඟහිටි වෙනත් ආදායම් ගිණුමට ගලපා තිබුණි. එම නිසා ලැබිය යුතු උසාවි දඩ රු.234,945ක් අඩුවෙන් හා හිඟහිටි වෙනත් ආදායම් රු.234, 945ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.995,986ක් වුවද එය රු.895,986ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. එම නිසා ලැබිය යුතු මුද්දර ගාස්තු හා මුද්දර ආදායම් රු.100,000ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඹ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසය වෙනුවෙන් ලද රු.386,000ක මුද්දර ගාස්තු ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට බැරකර තිබීම නිසා වර්ෂයේ මුද්දර ආදායම සහ ලැබිය යුතු මුද්දර ගාස්තු එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ඉකුත් වර්ෂවලදී මුද්දර ගාස්තු ආදායමෙන් අයකර තිබුණු සියයට 3ක පරිපාලන ගාස්තුව වූ රු.69,195ක් ගිණුම්වල ගැලපීම්කර නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ ඉකුත් වර්ෂයන්ට අදාල හිඟ ආදායම් ලැබීම් රු.513,463ක් විවිධ තැන්පත් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. මේ නිසා වගකීම් එම වටිනාකමින් වැඩියෙන්ද, අතිරික්තය රු.33,100ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල රු. 480,363ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.172,349ක ස්ථාවර තැන්පතු පොලී ගිණුම්ගතකර නොතිබුණි. එම නිසා අතිරික්තය හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඡ) ස්ථාවර තැන්පතු දෙකක් සඳහා ඉකුත් වර්ෂයට අදාලව ලැබුණු රු.116,817ක පොලී ආදායම ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. එම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සභාව සතු දේපළ 13ක් බදු දීමෙන් ලැබිය යුතු රු.4,051,598ක් ගිණුම්ගතකර නොතිබුණි. මේ නිසා අතිරික්තය රු.3,980,765ක් සමුච්චිත අරමුදල රු.70,833ක් හා ලැබිය යුතු දේපළ ආදායම් රු.4,051,598ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

ගිණුම් විෂයයන් 05කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.27,014,541ක් වූ අතර ලේඛන හා උපලේඛන අනුව ශේෂය රු.26,628,696ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) දීර්ඝ කාලයක සිට පැවත එන අයවිය යුතු පාර්ශවය හඳුනා නොගත් වෙළඳ ස්ථාන කුලී රු.6,351,392ක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) හිඟහිටි පොදු වෙළඳපොල කුලී සහ හිඟ හිටි කඩකාමර කුලී එකතුව රු.2,541,124ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2009 -2013 කාල පරිච්ඡේදයට අදාල එකතු කළ අගය මත බදු රු.4,319,539ක් සහ 2009 -2016 කාල පරිච්ඡේදයට අදාල මුද්දර බදු රු.382,516ක් සමාලෝචිත වර්ෂයේදීද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.7,156,420ක වත්කම් විෂයයක්, එකතුව රු.16,419,462ක වගකීම් විෂයයන් 04ක් සහ එකතුව රු.9,618,337ක ආදායම් විෂයයන් 04ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| (i) 24 වගන්තිය | - | සභාවට අයත් පාරවල් සහ පටු මංමාවත් වෙනුවෙන් මාර්ග ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන නොතිබුණි. |
| (ii) 158, 161,162, 163 හා 166 වගන්ති | 5,123,833 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) 159 වගන්තිය | 4,051,598 | වාර්ෂික ටෙන්ඩර්මත බදු දුන් දේපළවලින් අයවිය යුතු කුලී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති අංක 204 | - | 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් නොකළ භාණ්ඩ අයිතම් 25ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 03ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/9 දරන 1986 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1985 මාර්තු 20 දිනැති 08/01/38 අංක දරන චක්‍රලේඛය | - | සභා බලප්‍රදේශයේ සැලසුම් කමිටු අනුමැතියකින් තොරව ඉදිකර ඇති ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,841,630ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,171,964ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,194,000 | 2,194,000 | 17,755,120 | 2,416,902 | 8,119,400 | 8,119,400 | 5,519,014 | 5,123,833 |
| (ii) | කුලී | 8,878,400 | 8,878,400 | 13,222,570 | 9,394,519 | 14,440,900 | 14,440,900 | 3,871,766 | 8,892,516 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 768,690 | 768,690 | 1,021,339 | - | 967,600 | 967,600 | 1,782,614 | - |
| (iv) | වෙනත් ආදායම් | 14,010,100 | 14,010,100 | 20,038,898 | 6,031,315 | 22,420,100 | 22,420,120 | 15,904,962 | 5,499,925 |
| | එකතුව | **25,851,190** | **25,851,190** | **52,037,927** | **17,842,736** | **45,948,000** | **45,948,020** | **27,078,356** | **19,516,274** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට බිල්කරන ලද ආදායම රුපියල් මිලියන 25.8ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රුපියල් මිලියන 52ක් රැස්කර තිබුණි. කෙසේ නමුත් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 17.8ක හිඟයක් පැවතුණි.

### 2.2.3 වරිපනම්

(අ) සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.6,151,305ක් වූ වරිපනම් බදු ආදායමෙන් වර්ෂය අවසානවන විට රු.2,818,623ක් රැස්කර තිබුණු අතර, එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 46ක් තරම් අඩු අගයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේදී පැවති රු.2,414,575ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුළදී රු.467,658ක් අයකරගෙන තිබුණි. ඒ අනුව හිඟ වරිපනම් අයවීමේ ප්‍රතිශතය සියයට 19ක් තරම් ඉතා අඩු අගයක පැවතුණි.

### 2.2.4 කුලී

(අ) 2013 වර්ෂයේදී රජයේ තක්සේරුකරුවකු විසින් කඩකාමර කුලී තක්සේරුකර තිබුණු නමුත් එම නව තක්සේරු කුලී අයකිරීමට කටයුතු නොකිරීම නිසා රු.17,727,600ක ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානවන විට සභාව සතු කඩකාමරවලින් අයවිය යුතු හිඟ කුලිය රු.918,500ක් විය.

## 2.2.5 වෙනත් ආදායම්

(අ) සභා බලප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතා තැබීමේ ගාස්තු අයකිරීමට ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කර තිබුණද, ත්‍රීරෝද රථ නවාතැන් ස්ථාන සමීක්ෂණයක් සිදුකර අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ සංවර්ධනය නොකල ඉඩම්වල ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2ක වාර්ෂික බද්දක් අයකිරීමට ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කර තිබුණද, සංවර්ධනය නොකල ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාලව වෙළඳ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධකර තිබුණද රක්ෂණ ආයතනයකින් දැන්වීම් පුවරු සඳහා රු.181,950ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) ඇසල උත්සවය සමයේ පෞද්ගලික ආයතන 06ක් විසින් පවත්වාගෙන ගිය තාවකාලික ජංගම වෙළඳ කුටි 07ක් සඳහා රු.480,000ක මුදලක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

## 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,941,554ක් හා මුද්දර ගාස්තු රු.609,986ක් විය.

# 03. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 18ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) <u>සනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජූනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 ජූනි 05 දින වනවිටත් සකස්කර නොතිබුණි.

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් 2014, 2015 හා 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් 181ක් පරීක්ෂාකර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2015 ජූලි 06 දින පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලැබී තිබුණු රු.24,928,666ක් වටිනා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය වර්ෂය අවසානවන විටත් භාවිතාකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලදී රථගාල් 03ක ආදායම් රැස්කිරීම සඳහා කොමිස් පදනම මත යොදවා තිබුණු සේවකයින් 03 දෙනෙකුට ලබාදී තිබුණු රු.108,000ක් වටිනා ලදුපත් සභාව වෙත ආපසු භාරදී නොතිබුණු අතර අදාල මුදල් අයකර ගැනීමටද කටයුතුකර නොතිබුණි.

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් ස්ථිර හා ආදේශක සෞඛ්‍ය කම්කරුවන් 66 දෙනෙකු සහ මාර්ග කම්කරුවන් 13 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඉන් කම්කරුවන් 22 දෙනෙකුට වෙනත් තනතුරුවල රාජකාරි පවරා තිබුණි.

(ආ) සෞඛ්‍ය කම්කරු තනතුරේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා ආදේශක පදනමින් සෞඛ්‍ය කම්කරුවන් 35 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය අවසානවන විට සභා අරමුදලින් රු.9,271,186ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

සභාව විසින් බුක්තිවිදින ඉඩම් 28ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

**කොම්පෝස්ට් අංගනය කොන්ක්‍රීට් කිරීම**

ප්‍රමාණ පත්‍ර හා මැනුම් පත්‍ර සමග භෞතික වැඩ කොටස් පරීක්ෂාවේදී කොන්ක්‍රීට් ආවරණයේ උස අඟල් 1ක් අඩුවෙන් යොදා තිබුණි. මේ නිසා ඉටු නොකල කොන්ක්‍රීට් කියුබික් මීටර් 18.59ක් සඳහා රු.300,080ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි. ෙ

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩලය අනුමතකර නොගැනීම |
| | | (ii) | නිත්‍ය තනතුරට අදාල නොවන රාජකාරී පැවරීම |
| (ඇ) | ව්‍යාපෘති | | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |
| (ඈ) | ආදායම් පරිපාලනය | | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොයාම |
| (ඉ) | වත්කම් පාලනය | (i) | වර්ෂයේ ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම පොත්වලට ඇතුලත් නොකිරීම |
| | | (ii) | සභාව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |